20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍යයක් බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................................

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

නම :...............................................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.........................................

...............................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

අනු අත්සන් කරමි.

.................................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**දිවුරුම් ප්‍රකාශය**

......................................................... දිස්ත්‍රික්කයේ ..................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ..................................
ග්‍රාම නිලධාරි වසමේ....................................................................................................................................................පදිංචි
.................................................................................................................... වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පෞද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්කර ..................... රූඩ් ................... පර්. ..................... ක් වූ ඉඩම පවරා ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

...............................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

.................................................,
සාමදාන විනිශ්චයකාර තැන.

12-932/2

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01 හෙට්ටිආරච්චිගම, අංක 02 ගුරුළුපිටිගම, අංක 04 වරාවැව, අංක 22 පොතාන යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම පිළිබඳ වූ නිවේදනයයි**

01. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගිරිබාව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2019.03.07 දින පෙ.ව. 9.00 ට වරාවැව විහාරස්ථානයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| *(අ)* | දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| *(ආ)* | උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසය | ගිරිබාව |
| *(ඇ)* | ග්‍රාම නිලධාරී කොට්ඨාසය හෝ කොට්ඨාස | අංක 01 හෙට්ටිආරච්චිගම<br>අංක 02 ගුරුළුපිටිගම<br>අංක 04 වරාවැව<br>අංක 22 පොතාන |
| *(ඈ)* | ඉඩම පිහිටි ගම් | ඉහත වසම් වලට අදාළ ගම් |
| *(ඉ)* | ඉඩමේ නම | - |
| *(ඊ)* | ඉඩමේ පිහිටීම | ගිරිබාව ප්‍රාදේශීය සභා සීමාව තුළ |
| *(උ)* | අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය | නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා |
| *(ඌ)* | අන්සතු කරනු ලබන ඒකකය | පදිංචිය සඳහා පර්. 20 ක් සහ කෘෂිකාර්මික කටයුතු සඳහා උපරිමය අක්. 02 බැගින් |

02. 2008/4 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලනු ලැබේ. ඉහත ආදායම් කාණ්ඩයට අයත් බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

03. සියලුම ඉල්ලුම්පත්‍ර 2019.02.22 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කල යුතුය.

04. ඉල්ලුම්කරු ඉඩම ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේනම් 2019.03.07 වැනි දින පෙ.ව. 9.00 ට වරාවැව විහාරස්ථානයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම අයදුම්කරුවෙකුම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරනු ලබන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේදී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

06. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තෝරා ගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා වුවද එම ඉඩම වෙනුවෙන් නියම කරනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුනු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මිලට හිලව් කරනු ලැබේ.

07. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් ඔවුන් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවලදී ලබා ගත හැක.

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල.
(ii) ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගිරිබාව

ඩී. එම්. කේ. සී. දිසානායක,
පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2018 දෙසැම්බර් මස 11 වැනි දින දී ය.

ඉල්ලුම්පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01 හෙට්ටිආරච්චිගම, අංක 02 ගුරුළුපිටිගම, අංක 04 වරාවැව අංක 22 පොතාන යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :.................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :........................................................................................

3. *(අ)* ලිපිනය :....................................................................................................................................

*(ආ)* ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :..........................................................................................

*(ඇ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..............................................................................................

4. ගෘහ මූලික අංකය :........................................................................................................

5. ස්ත්‍රී/පුරුෂ භාවය :........................................................................................................

6. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :..............................................................................

7. උපන් දිනය :.........................................................................................

8. විවාහක/අවිවාහක බව :.............................................................................

9. රැකියාව :..........................................................................................

10. රැකියාව කරන ස්ථානය :.............................................................................

11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| *අනු. අංකය* | *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| *අනු. අංකය* | *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *පවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :................................................................................................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :- (තමාගේ ද?/බද්දට ද?/අනවසරයෙන් ද? යන වග) :...................................................................

15. නිවස පිහිටි ස්ථානය :...............................................................................................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :...........................................................................................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| *නම* | *වයස* | *ඉගෙනුම ලබන පාසලේ නම* | *ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත්ද ? එසේ නම් පහත සඳහන් විස්තර සපයන්න.

(i) ලබාගත් ණය මුදල :...........................................................................................................................................................

(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :.........................................................................................................

(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :..............................................................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද ? තිබේනම් පහත විස්තර සපයන්න.

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන

දිනය :....................................

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

නම :................................................................................ ..............................................,

ග්‍රාම නිලධාරි කොට්ඨාසය :........................................ ග්‍රාම නිලධාරිගේ අත්සන

අනු අත්සන් කරමි.

..............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන

**දිවුරුම් ප්‍රකාශය**

.......................................................... දිස්ත්‍රික්කයේ ..................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ...................................
ග්‍රාම නිලධාරි වසමේ.........................................................................................................................................................පදිංචි
......................................................................................................................... වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පෞද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්කර ..................... රූඩ් ................... පර්. ..................... ක් වූ ඉඩම පවරා ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති පරිදි අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බව ද වැඩිදුරටත් සහතික කරමි.

................................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

..................................................,
සාමදාන විනිශ්චයකාරතැන.

12-932/3

---

# අතුරු ව්‍යවස්ථා

## 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන පනත සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් සාදනු ලැබ මෙහි පහත සඳහන් කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය සමග කියවිය යුතු 122 වගන්තිය මගින් ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාව ඉහත කී 2 වන වගන්තියෙහි සඳහන් විධිවිධානවලට යටත්ව වයඹ පළාතේ සියලුම ප්‍රාදේශීය සභා සඳහා පිළිගැනීමට අදාළ බලය දෙනු ලැබේ.

අතුල විජේසිංහ,
ප්‍රධාන ආමාත්‍ය, හා පළාත් පාලන
විෂය භාර අමාත්‍ය,
වයඹ පළාත.

*ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව*

1. අරමුණ

බිංගිරිය ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ජීවත්වන පුද්ගලයින්ගේ සහ සමාජ කණ්ඩායම්වල අධ්‍යාපනික තොරතුරු සහ පුද්ගල සංවර්ධනය මෙන්ම නිර්මාණාත්මක සහ විනෝදාත්මක අවශ්‍යතා සපුරාලීමට විවිධ වූ මාධ්‍යවලින් සමන්විත සම්පත් හා සේවා සැපයීම සඳහා බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් මහජන පුස්තකාල සේවාවන් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර, ඊට අදාල විධිවිධාන සැලැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා පමුණුවනු ලැබේ.

2. බිංගිරිය ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා පරිදි පහත සඳහන් අංශ හා සේවා වලින් සමන්විත වේ.

i. බැහැර දෙන අංශය
ii. විමර්ශන අංශය
iii. ළමා අංශය
iv. වාර සඟරා අංශය හා පුවත්පත් අංශය
v. ශ්‍රව්‍ය දෘෂ්‍ය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
vi. අධ්‍යයන අංශය
vii. ග්‍රන්ථ සංරක්ෂණ අංශය
viii. දුර්ලභ ග්‍රන්ථ අංශය
ix. විශේෂිත එකතු හා ප්‍රාදේශීය එකතු
x. විඥාපන හා ප්‍රලේඛන සේවා අංශය
xi. ආබාධිත රෝහල් හා බන්ධනාගාර ප්‍රජාව සඳහා පුස්තකාල සේවා
xii. ඡායා පිටපත් සේවා
xiii. ප්‍රජා තොරතුරු සේවා
xiv. විස්තාරණීය සේවා (ජංගම හා ශාඛා පුස්තකාල ප්‍රදර්ශන, චිත්‍රපටි දර්ශන, දේශන ආදිය)
xv. වෙනත් තොරතුරු සේවා

3. බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සෑම මහජන පුස්තකාලයක් සඳහාම පුස්තකාලයාධිපතිවරයෙකු සිටිය යුතු අතර, එසේ පත්කරනු ලබන තැනැත්තා මහජන පුස්තකාලයේ සංවිධාන හා කළමනාකාරීත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාවට වග කිය යුතු වන්නේය.

1. මහජන පුස්තකාලයේ සංවිධානය හා කළමනාකාරීත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරි බිංගිරිය ප්‍රාදේශීය සභාවට වාර්තා කළ යුතු වන්නේය.

4. බිංගිරිය මහජන පුස්තකාල සේවාවට උපදේශකත්වය හා මගපෙන්වීම සඳහා මෙහි මින් මතු ''කමිටුව'' නමින් හඳුන්වනු ලබන පුස්තකාල උපදේශන කමිටුවක් පත් කළ යුතුය.

i. මෙම කමිටුව බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව පත් කරනු ලැබේ. එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

*(අ)* සභාපතිවරයා
*(ආ)* සභාවේ සභිකයන් අතුරින් සියලු කණ්ඩායම් නියෝජනය වන පරිදි එක් කණ්ඩායමකින් එක් සභිකයෙකු හෝ ඇතුළත් වන පරිදි තුන්දෙනෙකුට නොඅඩු සාමාජික සංඛ්‍යාවක්
*(ඇ)* සභා බල ප්‍රදේශයේ පදිංචි ජනතාව අදහන ආගම් නියෝජනය වන ආකාරයට එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බැගින්
*(ඈ)* ප්‍රදේශයේ ජීවත් වන ප්‍රභූන් හතර දෙනෙක්
*(ඉ)* බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම්
*(ඊ)* ප්‍රජා සංවර්ධන ලේකම්
*(උ)* බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සියලු පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරුන්
*(ඌ)* බිංගිරිය බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩලයක නියෝජිතයෙක්
*(එ)* බිංගිරිය බල ප්‍රදේශයේ විදුහලක විදුහල්පතිවරයෙක්

ii. කමිටුවේ සාමාජික සංඛ්‍යාව 23 ට නොවැඩි විය යුතුය.
iii. සභාපතිවරයා නිල බලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, එහි සෑම රැස්වීමකම මූලාසනය ඔහු දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයින් අතුරින් තෝරාපත් කර ගනු ලබන තැනැත්තෙකු එම රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.
iv. ප්‍රජා සංවර්ධන නිලධාරි කමිටුවේ ලේකම් විය යුතුය.

5. ගණ පූර්ණය :

*(අ)* ගණ පූර්ණය කමිටු සාමාජික සංඛ්‍යාවෙන් 1/2 ක් විය යුතුය.
*(ආ)* කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක් ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂව හා විපක්ෂව ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේය.

6. සාමාජිකත්වය :

i. බිංගිරිය පුස්තකාල සාමාජිකත්වය ලැබීම සඳහා පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.
ii. සාමාන්‍ය සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වයස අවුරුදු 12 ට වැඩි වීම, ළමා සාමාජිකත්වය සඳහා වයස අවුරුදු 12ට අඩුවීම, සහ
iii. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙක් හෝ අධ්‍යාපනය ලබන්නෙකු හෝ දේපළ හිමියෙකු හෝ රැකියාව කරන්නෙකු හෝ වීම.

ii. සාමාජික ගාස්තු :

සාමාජිකත්වය ආරම්භයේ දී රු. 50.00 ක ගාස්තුවක් ගෙවිය යුතුය. වසරකට වරක් රු. 30ක් ගෙවා සාමාජිකත්වය අළුත් කරවාගත යුතුය. ළමා සාමාජිකත්වය සඳහා ගාස්තුව ඉන් අඩකි.

එසේ වුවද සාමාජික ගාස්තු කමිටුවේ නිර්දේශය පරිදි බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියන් මගින් නියම කරනු ලැබිය හැකිය.

iii. ඇපකරුවන් :

(i) බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු ගෙවන්නෙකු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කළ යුතුය.
(ii) ළමා පාඨකයන් සහ පාසැල් සිසුන් සඳහා ඔවුන්ගේ මව/පියා/භාරකරු/විදුහල්පති/පන්ති භාර ගුරුවරයා සාමාජික අයදුම්පත සහතික කළ යුතුය.
(iii) ස්ථිර පදිංචිය පිළිබඳව ග්‍රා. නි. සහතිකය ඉදිරිපත් කළ යුතුය.

iv. සාමාජිකත්වය ලබා ගැනීම :

(i) බිංගිරිය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සේවාවන් අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුම බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන ගාස්තුවක් ගෙවා පුස්තකාලයාධිපති වෙතින් ලබා ගන්නා අයදුම්පත විසින් සාමාජිකත්වය ඉල්ලුම් කළ යුතු අතර එම අයදුම්පත්‍රය මෙහි පහත සඳහන් තැනැත්තෙකු ලවා සහතික කරවා ගත යුතුය.

1. පදිංචි ප්‍රාදේශයේ ග්‍රාම නිලධාරි
2. ආගමික පූජකවරයෙක්
3. සාමදාන විනිශ්චකාරවරයෙක්
4. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු,
5. බිංගරිය ප්‍රාදේශීය සභාවේ සභිකයෙක්
6. පාසල් අයදුම්කරුවෙකු නම් අයදුම්කරුගේ පන්ති භාර ගුරුවරයා විදුහල්පතිවරයාගේ සහතිකය

බිංගිරිය ප්‍රාදේශීය සෑම සාමාජිකයෙකුටම නිකුත් කරන ලද බලපත්‍රය

සංඛ්‍යාව සභාව විසින් පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශය මත කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ යුතුය.

7. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට නිකුත් කර ලද බලපත්‍රයක් මත සාමාජිකයා විසින් රැගෙන යන ලද සෑම පොතක් සඳහාම ඔහු වගකිව යුතුය. සෑම සාමාජිකයෙකුටම නිකුත් කලයුතු බලපත්‍ර සංඛ්‍යාව පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශය මත බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියකින් තීරණය කල යුතු ය.

8. බැහැර දෙන පුස්තකාල සාමාජිකයෙකු විසින් පුස්තකාලයෙන් ලබා ගන්නා පොතක් එය ලබා ගන්නා ලද දින සිට දින 14 ක් ඇතුළත පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දිය යුතුය. එවැනි යම් පොතක් වෙනත් සාමාජිකයෙක් විසින් ඉල්ලා නොමැති නම් ඒ පොත වැඩිදුර දින 14ක් සඳහා ලබා ගැනීම සඳහා පුස්තකාලාධිපති විසින් ඒ සාමාජිකයාට අවසර දෙනු ලැබිය හැකිය.

9. 8 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දින 14 ක් කාල සීමාව ඇතුලත යම් පොතක් පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දීම සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක පොත ආපසු භාර දිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දිනයක් වෙනුවෙන් රු. 1.00 බැගින් හා ළමා පාඨකයින් සඳහා සත 50 බැගින් දඩ මුදලක් හෝ කමිටුවේ නිර්දේශය මත බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කළින් කළ යෝජනා සම්මුතියක් මගින් නියම කර ගනු ලබන යම් මුදලක් දඩ වශයෙන් ගෙවීමට යටත් වන්නේය.

10. බැහැර දෙන පුස්තකාලයේ තමා විසින් ලබා ගන්නා ලද පොතක් 8 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දවස් 14 ක කාල සීමාව ඉකුත් වීමෙන් පසුව පහත දක්වෙන අයුරින් දඩ මුදල් අය කරනු ලැබේ.

| | |
|---|---|
| දින 1-30 දක්වා එක් දිනකට එක් පොතකට | රු. 1.00 බැගින් |
| දින 31-90 දක්වා එක් පොතකට | රු. 40.00 බැගින් |
| දින 91-180 දක්වා එක් පොතකට | රු. 80.00 බැගින් |
| දින 180 කට වැඩි දින සඳහා එක් පොතකට | රු. 100 බැගින් |

එසේ වුවද ළමා පාඨකයෙක් වන අවස්ථාවක අය කළ යුතු වන්නේ 10 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රමාද ගාස්තුවලින් අඩකි.

11. පොතක් නැති වූයේ යැයි සලකන අවස්ථාවක එම පොතේ වටිනාකම බැඳුම් ගාස්තු හා එම පොත ආපසු සපයා ගැනීමේ වියදම හා 10 වන අතුරු ව්‍යවස්ථාවේ දඩ මුදල් අදාල සාමාජිකයා විසින් දැරිය යුතුය. මෙහිදී සම්මත ක්‍රම සහ උපදේශන කමිටු නිර්දේශ පදනම් කර ගනිමින් අය විය යුතු ගාස්තු පුස්තකාලයාධිපතිවරයා විසින් තීරණය කල යුතුය.

12. සාමාජිකයෙකු විසින් පුස්කාලයෙන් ලබා ගත් පොතකට හානි කිරීම හෝ කවර හෝ ආකාරයකින් එය විරූපි කිරීම නොකළ යුතුය.

13. බැහැර දෙන පුස්තකාලයෙන් ලබා ගත් පොතකට සිදු වී ඇති හානි වීමක් පිළිබඳව දැනගත් වහාම පුස්කාලයාධිපති වරයාට දැනුම් දීම සෑම සාමාජිකයෙකු විසින්ම සිදු කළ යුතුය. එවැනි හානියක් හෝ විරූපී වීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සාමාජිකයා විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත එම සාමාජිකයාට හානියක් හෝ විරූපි කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සලකනු ලැබේ.

14. සාමාජිකයෙකු විසින් ආපසු භාර දෙන ලද පොතක් තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමටම ඔහු විසින් හානි කර හෝ විරූපී කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයා විසින් සෑහීමට පත් වන්නා වූ අවස්ථාවක ඒ පොත නැවත සපයා ගැනීමේ වර්තමාන වියදම් දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව හානි වූ පොත ''මහජන පුස්තකාලය හානි වූ පොතක් ලෙස විකුණන ලදී'' යනුවෙන් මුද්‍රා තබා ඒ සාමාජිකයාට ආපසු දිය යුතුය. එසේ සපයා ගනු ලැබූ පොතට, නැතිවූ පොතෙහි පරිග්‍රහණ අංකය යෙදිය යුතුය. එසේ සැපයීමට අපොහොසත් වුවහොත් නැති වූ පොතක් සේ සලකා 11 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි කටයුතු කළ යුතුය.

15. (i) පුස්තකාලයෙන් ලබාගත් පොතක් කිසිම සාමාජිකයෙකු විසින් අන්සතු නොකළ යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයෙකුගේ සාමාජික මුදල අහිමි වන අතර බැහැර දෙන පුස්තකාලයේ ඔහුගේ සමස්ත සාමාජිකත්වය ද අහෝසි වන්නේය.

16. (i) ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකු පාවිච්චි කළ බව තමා දන්නා කිසිම පොතක් කිසියම් සාමාජිකයෙකු විසින් බැහැර දෙන පුස්තකාලයට ආපසු භාර නොදිය යුතු අතර, ඒ පිළිබඳව වහාම පුස්තකාලයාධිපතිට දැනුම් දී පුස්කාලයාධිපති විසින් දෙනු ලබන උපදෙස් හා නියමයන් පරිදි අදාළ සාමාජිකයා විසින් ඒ පොත සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය.

(ii) පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විට ඒ පොත විනාශ කළ යුතු අතර, එය නැවත සපයා ගැනීමේ වියදම් ඒ සාමාජිකයා පුස්තකාලයාධිපතිවරයාට ගෙවිය යුතුය.

17. කිසියම් පොතක් ලබා දිය යුත්තේ කවර සාමාජිකයාටද යන්න පිළිබඳව මත භේදයක් බැහැර දෙන පුස්තකාලයක සාමාජිකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර, උද්ගත වූ අවස්ථාවක ඒ මත භේදය පුස්තකාලයාධිපතිවරයා විසින් විසඳිය යුතුය.

18. බැහැර දෙනු ලබන පුස්තකාලයේ ඇති පොතක් හෝ පුස්තකාල ද්‍රව්‍යක් සම්බන්ධයෙන් කිසියම් සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටි විටෙක එය නිකුත් කළ යුතු අතර, ඒ වෙන විටක් එකී පොත නිකුත් කර තිබුනේ නම් ඉල්ලුම්කරුගේ හෝ ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයක සටහන් කරගෙන පුස්තකාල ද්‍රව්‍ය පුස්තකාලයට ලැබුණු පසු ඒ ඒ තැනැත්තාට ලබා දීමට පුස්තකාලයාධිපතිවරයා ක්‍රියා කළ යුතුය.

19. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රමිතීන් අනුව නියමිත දිනයන් පැය ගණන පාඨකයන් සඳහා පුස්තකාලය විවෘතව තැබීම කළ යුතුය. එහෙත් විශේෂ හේතුවක් මත සභාවේ අභිමතය පරිදි පුස්තකාලය විවෘතව තබන දිනයන් හා වේලාවන් තීරණය කළ හැකිය.

20. විමර්ශන අංශය :-

(i) පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ඇතිව විමර්ශන අංශයේ තබා ඇති ලේඛනයේ අත්සන් තබා විමර්ශන ග්‍රන්ථ පරිශීලනය කළ යුතුය.

(ii) කියවීම සඳහා තමන් වෙත නිකුත් කරන ලද කිසියම් පුස්තකාල ද්‍රව්‍යයක් විමර්ශන අංශයෙන් පිටතට ගෙන නොයා යුතුය. එසේ වුවද ඡායා පිටපත් සේවාවක් ක්‍රියාත්මක වන්නේ නම් පුස්තකාලයාධිපතිවරයාගේ අනුමැතිය හා භාරකාරත්වය යටතේ එම ප්‍රකාශනයේ අවශ්‍ය පිටු නියමිත ගාස්තු ගෙවා පිටපත් කර තබා ගැනීමට ඡායා පිටපත් ඉල්ලා සිටින යම් තැනැත්තෙකුට ඉඩකඩ සැලැස්විය යුතුය.

21. කියවීම් ශාලාව.- සතියේ සෑම දිනකම පුස්තකාලයේ කියවීම් ශාලාව පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වා හෝ කමිටුවේ නිර්දේශය මත සභාව විසින් තීරණය කරනු ලබන දිනයන් හා වේලාවන් තුළ විවෘත කර තැබිය යුතුය. කියවීම් ශාලාව පරිහරණය කිරීමට ඕනෑම තැනැත්තෙකුට හැකි වන අතර, ඒ සඳහා කියවීම් ශාලාවේ තබා ඇති ලේඛනයේ නම සහ පැමිණි වේලාව සටහන් කර අත්සන් තබා කියවීම් ශාලාවේ සේවාවන් ප්‍රයෝජනයට ගත යුතුය.

22. කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයත් පුවත්පතක්, වාර ප්‍රකාශනයක්, සඟරාවක්, සිතියමක් හෝ වෙනත් පුස්තකාල ද්‍රව්‍යකට හානියක් සිදු නොකළ යුතු අතර, බැහැර ගෙන යාමද නොකළ යුතුය.

23. කිසියම් තැනැත්තෙකු -

(i) පුස්තකාල පරිශ්‍රය තුළ හෝ අවට නොහික්මුණු ආකාරයෙන් හැසිරීම හෝ හිරිහැරයක් ඇති කිරීම හෝ නොකළ යුතුය.
(ii) පුස්තකාලයෙහි හෝ ඒ අවට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ යම් ගොඩනැගිල්ලක කොටසක හෝ යම් දේපළකට අලාභයක් කිරීම හෝ යම් ආකාරයකින් ඒවා විරූපී කිරීම හෝ නොකළ යුතුය.
(iii) පුස්තකාලය විවෘතව තබන වේලාවෙන් පසු එකී පුස්තකාල පරිශ්‍රය තුළ සිටීම හෝ නිකරුණේ හැසිරීම හෝ නොකළ යුතුය.
(iv) පුස්තකාල පරිශ්‍රය තුළ දුම්බීම නොකළ යුතුය.
(v) පුස්තකාල පරිශ්‍රය ඇතුලත ඝෝෂා කිරිමෙන්, ගී ගැයීමෙන් හෝ වෙනත් ශබ්ද නැගීමෙන් එම පුස්තකාලය පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.
(vi) පුස්තකාල පරිශ්‍රයට කිසිම සතෙකු ගෙන නොආ යුතුය.
(vii) පුස්තකාලය තුළ නිදා ගැනීම හෝ ආහාර ගැනීම නොකළ යුතු ය.
(viii) පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලයාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තෙකුට හෝ මේ අතුරු ව්‍යවස්ථාවක් යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා බාධා නොකල යුතු ය.
(ix) පුස්තකාලය තුළ අනවසරයෙන් රූගත කිරීම, ශබ්ද පැතිරවීම, ගුවන්විදුලි ගත කිරීම හෝ මේ අතුරු ව්‍යවස්ථාවක් යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරිමෙහි ලා බාධා නොකළ යුතුය.
(x) ජංගම දුරකථන, කැමරා, ලයිටර් ආදිය පුස්තකාලය තුළට ගෙන ඒම තහනම් වේ. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි කටයුතු නොකරන යම් පුද්ගලයෙකු පුස්තකාල පරිශ්‍රයෙන් ඉවත් කිරීමේ බලය පුස්තකාලයාධිපති සතු වේ.

24. බැහැර දෙන අංශය හැර විමර්ශන අංශය සහ අනෙකුත් අංශ පරිහරණය කිරීම සඳහා කමිටුවේ නිර්දේශය මත සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් පුස්තකාලයේ සාමාජිකයින් නොවන අයගෙන් අය කළ හැකිය.

25. වාර්ෂික තොග සමීක්ෂණය.- පුස්තකාල සඳහා සෑම වර්ෂයක් පාසාම වාර්ෂික තොග සමීක්ෂණයක් පැවැත්වීම බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ වගකීම වන්නේය. වාර්ෂික සමීක්ෂණ වාර්තා සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද නිර්දේශ සභා සම්මත දිනෙන් මාස තුනක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතුය.

26. විස්තාරණීය සේවා.- දේශන, සම්මන්ත්‍රණ වැඩමුළු හා වෙනත් විස්තාරණීය සේවා සඳහා සභාව විසින් පහසුකම් සැලසිය යුතුය.

27. පළාත් පාලන ආයතන බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රාජ්‍ය නොවන කිසියම් ආයතනයක්/සංවිධානයක් විසින් කිසියම් හෝ පුස්තකාලයක්/පුස්තකාල සේවාවක් පවත්වාගෙන යනු ලබන්නේ නම් එම ආයතනය/සංවිධානය විසින් අදාළ පළාත් පාලන ආයතනයේ එනම් බිංගිරිය ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වන්නේය. (මෙය පාසැල් පුස්තකාල, පිරිවෙන් පුස්තකාල හා ආගමික ස්ථානවල ඇති පොත් ගුල් ආදිය සඳහා බල නොපැවැත්වේ.)

28. මෙම අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම පිළිබඳව, ඒ උල්ලංඝනය ස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියක් හත්සිය පනහකට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටෙක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් බිංගිරිය ප්‍රාදේශීය

සභාවේ සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම රුපියල් දෙසීය පනහකට නොවැඩි අතිරේක දඩයකින් යුත් දඬුවමක් හා සාමාජිකත්වය අහිමි කිරීමක් සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස ;

''පුස්තකාලයාධිපතිවරයා යන්නෙන්'' වයඹ පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පුස්තකාල සේවාවට අයත් බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය භාරව කටයුතු කරන ප්‍රධාන නිලධාරියා වන්නේ ය.

''ප්‍රජා සංවර්ධන නිලධාරින් යන්නෙන්'' පළාත් පාලන කොමසාරිස්වරයා විසින් බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන කටයුතු පිණිස පත් කරනු ලැබ ඇති මාණ්ඩලික නිලධාරියා ද,

''පුස්තකාල සම්පත් යන්නෙන්'' ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය, දෘෂ්‍ය මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය අදහස් කෙරේ.

''සභාව යන්නෙන්'' බිංගිරිය ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''කමිටුව යන්නෙන්'' පුස්තකාල උපදේශිකා කමිටුව අදහස් කෙරේ.

''ප්‍රභූන් යන්නෙන්'' බිංගිරිය ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ ජීවත්වන කීර්තිමත් කැපී පෙනෙන සමාජ මෙහෙවරක් ඉටු කරනු ලබන උගත් බුද්ධිමත් පුද්ගලයින් අදහස් කෙරේ.

12-937/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.